විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ශ්‍රේණිය - 8

මාසය - නොවැම්බර් සතිය - 02 ක්‍රියාකාරකම් අංකය - 42

සැකසුම- එම්.එච්.ඩී.මධුමාලි ,ර/ඇඹි/ගගේයාය විද්‍යාලය ,ඇඹිලිපිටිය

## 6 - අන්තර්ජාලයේ සැරිසරමු

### 6.1 සෙවුම් යන්ත්‍ර

**ශිෂ්‍ය කාර්යය -**

- පහත දී ඇති සටහන හොඳින් කියවා අවබෝධ කරගන්න.

**සෙවුම් යන්ත්‍ර හඳුනා ගනිමු.**

- වෙබ් අතිරික්සු භාවිතයෙන් අන්තර්ජාලයේ තොරතුරු සෙවීමේදී වෙබ් අතිරික්සුව විවෘත කර එහි ලිපින තීරුවෙහි වෙබ් අඩවියේ සම්පූර්ණ ලිපිනය යතුරුලිනය කිරීමට අවශ්‍යයි. අන්තර්ජාලය තුල වෙබ් අඩවි මිලියන ගණනක් තියෙන නිසා මේ සියල්ලේම සම්පූර්ණ නම් මතක තබා ගැනීම අපහසු වුණා. මෙයට විසඳුමක් ලෙස සෙවුම් යන්ත්‍ර නිර්මාණය වුණා. <u>සෙවුම් යන්ත්‍ර වල වාසිය වනුයේ සෙවුම් කොටුව තුළ සෙවීමට අවශ්‍ය තොරතුරු වල මූලපද පමණක් යතුරුලියනය කර සෙවුම් බොත්තම ක්‍රියාත්මක කළ විට ඒ සම්බන්ධ විශාල වෙබ් අඩවි සංඛ්‍යාවක් නිරූපණය වීමයි.</u>

- ඔබගේ කියවීම් පොතෙහි පිටු අංක 63, 64 සහ 65 හොඳින් කියවා තේරුම්ගන්න.
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- පහතින් දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ඔබ සතුව පරිගණකයක් හෝ ජංගම දුරකථනයක් තිබේනම් වැඩ පොතෙහි 6.2 ක්‍රියාකාරකමට අදාළ පියවර අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=9855
- වෙනත් -
  - Youtube- https://youtu.be/gnwMrUSxmos
  - සවියෙන් පෙරට - අපි එකට e- ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය - https://drive.google.com/file/d/1KFJOEo8NMtekAoSMZqZiFual1glMdW2/view?usp=sharing

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- සෙවුම් යන්ත්‍ර යනු නිර්වචනය කරයි.
- සෙවුම් යන්ත්‍ර භාවිතයේ අවශ්‍යතාව සහ වැදගත්කම හඳුනා ගනියි .
- එදිනෙදා කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීමට තොරතුරු තාක්ෂණය යොදා ගනියි.
- හොඳින් කියවා සහ සවන් දී අවබෝධයෙන් යුතුව පිළිතුරු සපයයි.

- **ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

1. ප්‍රධාන සෙවුම් යන්ත්‍ර කිහිපයක් ලැයිස්තු ගත කරන්න.
2. වෙබ් අතිරික්සු සහ සෙවුම් යන්ත්‍ර අතර වෙනස කුමක්දැයි පහදන්න.
3. e නැණපියස අන්තර් ක්‍රියාකාරී ක්‍රියාකාරකම සිදු කරන්න.
   https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=19062